නිවේදන අංකය : **04** WW/O/18/10/08/04

වර්ණය :

# තද වැසි, තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳව අනතුරු ඇඟවීම

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**

2018 ඔක්තෝබර් මස 09 වන දින පෙ.ව.10.30 වන තෙක් වලංගු වන පරිදි

2018 ඔක්තෝබර් මස 08 වන දින පෙ.ව. 10.30 නිකුත් කරන ලදී.

## මුහුදු ප්‍රදේශ සඳහා

**සැලකිලිමත් වන්න!**

මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ මාතර හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි සමඟ සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.

ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.

## අරාබි මුහුදු ප්‍රදේශ සඳහා (බහු දින යාත්‍රා සඳහා)

ගිනිකොණදිග අරාබි මුහුදු ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය මේ වන විට සුළි සුළඟක් (LUBAN) දක්වා වර්ධනය වී ඇති අතර උතුරු අක්ෂාංශ 12.3 ත් නැගෙනහිර දේශාංශ 62.4 ත් ආසන්නයේ මේ වන විට ස්ථාන ගතව ඇති අතර එය කොළඹ සිට කි.මී 2000 ක් පමණ දුරින් පවතී.

මෙම පද්ධතිය තවදුරටත් වර්ධනය වෙමින් ඉදිරි පැය 24 තුලදී චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වන අතර බටහිරට බරව වයඹ දෙසට ගමන් කරනු ඇත.

මෙම පිහිටීමේ සිට කි.මී 100 ත් කි.මී 200 ත් අතර ප්‍රදේශයේ ඉතා තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි /ඉතා රළු මුහුදු ප්‍රදේශ,ඉතා තද සුළං ඇතිවේ.

මෙම මුහුදු ප්‍රදේශයේ ධීවර සහ නාවුක කටයුතු වලින් වැලකි සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/10/08
Time : 11:02
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE




**Source: Joint Typhoon Warning Centre**

<u>බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ සඳහා (බහු දින යාත්‍රා සඳහා)</u>

මධ්‍යම, සහ ආසන්න ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල කැළඹිලි තත්ත්වය මේ වන විට අඩු පීඩන තත්ත්වයක් දක්වා වර්ධනය වී ඇති අතර උතුරු අක්ෂාංශ 12.9 ත් නැගෙනහිර දේශාංශ 90.4 ත් ආසන්නයේ මේ වන විට ස්ථාන ගතව ඇත. මෙම පද්ධතිය තවදුරටත් වර්ධනය වෙමින් ඉදිරි පැය 24 තුලදී දක්වා පීඩන අවපාතයක් වර්ධනය වන අතර දිවයිනෙන් ඉවතට වයඹ දෙසට ගමන් කරනු ඇත.

අද පෙ.ව.09.00 වනවිට තත්ත්වය

දිවයිනට නිරිත සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල ක්‍රියාකාරී වලාකුළු පද්ධතියක් වර්ධනය වී ඇත .

අනාවැකිය

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/10/08
Time : 11:02
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE




**Source: RSMC Bulletin-IMD**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018 / 10 / 08
Time : 11 : 02
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE